CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය

*2011 අගෝස්තු 17, කොළඹ, ශ්‍රී ලංකාව*

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ ඒකකය විසින් පවත්වන ලද නව සමීක්ෂණයකට අනුව යුද්ධයට හේතු වූ මූලික කාරණා සඳහා පිළියම් යෙදීම වෙනුවෙන් රජය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු කර ඇත්ද යන්න පිළිබඳව ශ්‍රී ලාංකිකයින් එකිනෙකට වෙනස් මත දරන බව හෙළි වී ඇත.

දෙමළ ප්‍රජාවෙන් 32% ක්, මේ සම්බන්ධව රජය කිසිවක්ම කර නැතැයි පවසන අතර, සිංහල ප්‍රජාවෙන් 41.1% ක් විශ්වාස කරනුයේ, රජය මේ පිළිබඳව විශාල වැඩ කොටසක් ඉටු කර ඇති බවයි. උඩරට දෙමළ ජාතිකයින්ගෙන් 44%ක් සහ මුස්ලිම් ජාතිකයින්ගෙන් 52%ක් විශ්වාස කරනුයේ, රජය මේ සම්බන්ධව තරමක් දුරට වැඩ කර ඇති නමුත් එය යුද්ධයට හේතු වූ කාරණා සඳහා පිළියම් යෙදීම වෙනුවෙන් ප්‍රමාණවත් නොවන බවයි.

වත්මන් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව පොදුජන දැක්ම, එනම් ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් ඔවුන් තේරුම් ගන්නේ කුමක්ද? ඔවුන් ඊට සහභාගි වන්නේ කෙසේද?, රාජ්‍ය ආයතන සහ ප්‍රතිපත්තීන් පිළිබඳ ඔවුන් තුළ ඇති විශ්වාසය කෙබඳුද? යනාදි වශයෙන්, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ රටේ පොදු ජනයාගේ ආකල්පය කවරාකාරද යන්න විමසීම අරමුණු කොටගෙන මේ '**පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය**' සමීක්ෂණය පවත්වන ලදි. සමීක්ෂණයට ලක් කෙරුණු ප්‍රධාන අංශ අතර, ආර්ථිකය සහ ආරක්ෂාව, මාධ්‍ය පිළිබඳ මහජනයාගේ මතය සහ මාධ්‍ය පරිශීලනයේ ප්‍රවණතා, දේශපාලනය පිළිබඳ පොදුජන අදහස්, නිදහස, දේශපාලන නායකයින්, ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය, දූෂණය සහ සංවර්ධනය යන ක්ෂේත්‍ර පිළිබඳ පොදුජනයාගේ තක්සේරුව ආදිය ඇතුළත් වෙයි.

මේ සමීක්ෂණය රට පුරා දිස්ත්‍රික්ක 25 තුළ කරන ලද අතර ප්‍රධාන ජනවර්ග හතරට අයත් පුද්ගලයින් 1993 දෙනෙකු සමග සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදි. පුද්ගලයින් සමග සම්බන්ධ වීමේ දුෂ්කරතා සහිත ප්‍රදේශ කිහිපයක හැර අනෙක් සෑම තැනකදීම ප්‍රතිචාරකයින් තෝරා ගන්නා ලද්දේ අහඹු ලෙසය. 2011 වසරේ මාර්තු සිට ජුනි දක්වා කාලය තුළදී ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු කරන ලදි.

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටළුවට දේශපාලන විසඳුමක් ඉදිරිපත් කිරීම පිළිබඳව කරන ලද විමසීමේදී, සිංහල ජාතිකයින්ගෙන් 29.7%ක්, දෙමළ ජාතිකයින්ගෙන් 59.1% ක්, උඩරට දෙමළ ජාතිකයින්ගෙන් 30.8%ක් සහ මුස්ලිම් ප්‍රජාවෙන් 53.5% ක් පළ කළ මතය වූයේ සර්ව පාක්ෂික කමිටුව විසින් යෝජිත නිර්දේශ පදනම් කරගනිමින් ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවයි. කෙසේ වෙතත් සිංහල ජාතිකයින්ගෙන් 17.6% ක්, දෙමළ ජාතිකයින්ගෙන් 4%ක්, උඩරට දෙමළ ජාතිකයින්ගෙන් 11.1% ක් සහ සහ මුස්ලිම් ජාතිකයින්ගෙන් 14.2% ක් කියා සිටියේ, එල් ටී ටී ඊ සංවිධානය හමුදාමය වශයෙන් සම්පූර්ණයෙන්ම පරාජය කර ඇති බැවින්, දේශපාලන විසඳුමක අවශ්‍යතාවක් දැන් නැති බවයි.

වර්තමානයේ සිදුවෙන සංවර්ධන ක්‍රියාදාමය තුළින් අපේක්ෂා කරන ප්‍රධානතම ප්‍රතිඵලය කුමක්ද යන්න පිළිබඳව ජනවර්ග හතරටම අයත් පිරිස් එකම අදහසක් පළ කළහ. ඒ අනුව, ජීවන වියදම පහළ යනු දැකීම පොදුවේ සියලු දෙනාගේම ප්‍රධානතම ප්‍රමුඛතාව ලෙස දක්වා ඇත. යටිතල පහසුකම් දියුණු වීම, සංවර්ධන ක්‍රියාවලියෙන් අපේක්ෂිත ප්‍රතිඵල අතුරින් දෙවෙනි ප්‍රමුඛතාව ලෙස සිංහල ජාතිකයින් දක්වා සිටිද්දී, අනිත් ජනවර්ග තුනට අයත් නියෝජිතයින් දක්වා සිටියේ,

ඔවුන්ගේ දෙවෙනි ප්‍රමුඛතාව වන්නේ විරැකියාව දුරු කිරීම සහ රැකියා අවස්ථා වැඩියෙන් නිර්මාණය වීම බවයි.

රටේ සංවර්ධනය වේගයෙන් සිදුවන පමණින් දූෂණ වංචා නොසලකා හැරිය නොහැකියැයි සිංහල ජාතිකයින් බහුතරයකින් සමන්විත වන ශ්‍රී ලාංකිකියෝ 65% ක් සිතති. දූෂණ වංචා වැඩිම ආයතනය හැටියට ජනවර්ග හතරටම අයත් ප්‍රතිචාරකයින්ගෙන් බහුතරයක් දෙනා විශ්වාස කරන්නේ පොලීසියයි.

රටේ ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් ආණ්ඩුව සාධනීය වැඩ කොටසක් ඉටු කරන බව ජනවර්ග හතරටම අයත් ප්‍රතිචාරකයින්ගෙන් බොහෝ දෙනෙක් විශ්වාස කරති. කෙසේ වෙතත් සිංහල ජාතිකයින්ගෙන් 26.2% ක්, දෙමළ ජාතිකයින්ගෙන් 24% ක්, උඩරට දෙමළ ජාතිකයින්ගෙන් 18.4% ක් සහ මුස්ලිම් ජාතිකයින්ගෙන් 29.2%ක් දෙනා කියා සිටියේ රටේ ආර්ථික කළමණාකරණය සම්බන්ධයෙන් ආණ්ඩුව සතුටු විය හැකි වැඩ කොටසක් ඉටු කර නැති බවයි.

රටේ සාමාන්‍ය ආර්ථික තත්ත්වය විශාල වශයෙන් දියුණු වී ඇති බව ශ්‍රී ලාංකිකයින්ගෙන් 10.7%ක් පැවසූ අතර, 38% ක් කියා සිටියේ ආර්ථික තත්ත්වය දියුණු වී ඇත්තේ සුළු වශයෙන් බවයි. කෙසේ වෙතත්, 19.7%ක් රටේ ආර්ථික තත්ත්වය තරමක් දුරට පිරිහී ඇති බව කියා සිටිය අතර තවත් 16%ක් දෙනා පවසා සිටියේ, රටේ ආර්ථිකය බෙහෙවින්ම පිරිහී ඇති බවයි. කුටුම්භය තුළ ආර්ථික තත්ත්වය පිළිබඳ විමසීමේදී, බොහෝ දෙනෙකුගේ අදහස වූයේ පසුගිය වසර දෙක තුළ යහපත් වර්ධනයක් සිදු වී නැති බවයි. පසුගිය වසර දෙක තුළදී නිවසේ ආර්ථික තත්ත්වය බොහෝ සේ දියුණු වී ඇතැයි විශ්වාස කරන්නේ 3.7%ක් පමණි. නිවසේ ආර්ථිකය තරමක් දුරට දියුණු වී ඇති බව 27%ක් දෙනා කියා සිටියහ. උඩරට දෙමළ ජාතිකයින්ගෙන් 58.3%ක් පැවසූයේ පසුගිය වසර දෙක තුළදී ඔවුන්ගේ නිවසේ ආර්ථික තත්ත්වය බෙහෙවින්ම දුර්වල වී ඇති බවයි.

####

Social Indicator යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ ඒකකයි. ශ්‍රී ලංකාවේ සමාජ දේශපාලන කාරණා පිළිබඳව මත විමසීම් පැවැත්වීම සඳහා වෘත්තීයමය සහ ස්වාධීන ආයතනයක් නොමැති කම පිළිබඳ දීර්ඝ කාලයක් පුරා පැවති රික්තය පුරවමින් 1999 දී Social Indicator ආයතනය ස්ථාපිත කරන ලදි. මත විමසීම් යනු ප්‍රජාතන්ත්‍රවාදය බලගන්වන මෙවලමක්ය යන විශ්වාසය පෙරදැරි කරගෙන ක්‍රියාත්මක වන Social Indicator ආයතනය, විශාල පරාසයක වූ සමාජ ආර්ථික සහ දේශපාලන කාරණා මුල් කොටගනිමින් මත විමසීම් රාශියක් පවත්වා ඇත.

සම්පූර්ණ සමීක්ෂණ වාර්තාව සඳහා පිවිසෙන්න :

වැඩිදුර තොරතුරු සඳහා iromi@cpasocialindicator.org හරහා ඉරෝමි පෙරේරා අමතන්න.